# බෝධිවංශය සාහිත්‍ය ග්‍රන්ථයකි.

බෞද්ධ පූජනීය වස්තුවක ඉතිහාසය කියා පෑමේ අරමුණකින් ලියැවුණ ද සිංහල බෝධිවංශය සාහිත්‍ය ග්‍රන්ථයක් වශයෙන් අගය කිරීමේ අපහසුවක් නැත. එය සපුරා ම ආගමික සාහිත්‍ය ග්‍රන්ථයකි. එසේ ම ලෞකික සාහිත්‍ය ග්‍රන්ථයක් වශයෙන් ද සැලකීමට ප්‍රමාණවත් කරුණු ද එහි අඩංගු වෙයි.

පිරිනිවන් පෑ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී දේහය පිළිබඳ ආදාහනාදී කටයුතු අවසන් කර විහාරයට පැමිණි ආනන්ද හිමියන් පිළිබඳ මේ ප්‍රකාශය බලන්න.

*ස්වාමිනි, බුදුරජාණන් වහන්ස, මේ නුඹ වහන්සේ පැන් සතපන වේලාව නොවේ ද? මේ නුඹ වහන්සේ භික්ෂූන්ට අවවාද දෙන වේලාව නොවේ ද? මේ නුඹ වහන්සේ සිංහ ශය්‍යාව කරන්නාවූ වේලාව නොවේ ද? මේ නුඹ වහන්සේ දැවටු දඹු වළඳන වේලාව නොවේ ද? යනාදී ක්‍රමයෙන් හඬන සේක්...*

(ප්‍රථම සංගීති කථා)

පියාගේ වියෝවෙන් දුකට පත් පුතෙකුගේ විලාපයක් නොවේ ද මේ? සිය පියාගේ වියෝගයේ දුක, ඒ නිසා ඇතිවන තනිකම හා ඒ පදනම් කොට ඇතිවන දුක වැඩියෙන් ම දැනෙන්නේ අවමඟුල් කටයුතු අවසන් කොට නෑසියයන් නිවෙසින් නික්ම ගොස් නිවසේ තනිව වෙසෙන විට ය. ආනන්ද හිමියන්ට ද එසේ ය. දැන් විහාරය පාළු ය.බුදුරදුන් හමුවට එදා පිමිණි ජන ගංගාව අද නැත. ආනන්ද හිමියන්ට එදා තිබුණු කාර්ය බහුලත්වය ද අද නැත. ඒ නිසා තනිව වෙසෙන හිමියන්ට බුදුරදුන් පරිහරණය කළ යම් යම් දේ දැකීමෙන් වියෝ දුක තදින් දැනේ. ඒ තත්වය අපේ සිතට ද දුකක් නංවමින් කතුවරයා ඉදිරිපත් කරන ඉහත පාඨයෙන් මැනවින් නිරූපණය නො වන්නේ ද? එහි යොදාගත් වචන මාලාව හා ඉදිරිපත් කෙරෙන අදහස් රසිකයාගේ සිත කම්පනයට පත් කරන සුලු ය. මෙවැනි කාර්යයක් සිදු කෙරෙන්නේ සාහිත්‍ය ග්‍රන්ථයකින් මිස අන් කවරකින් ද?

“ආර්යමාර්ග නැමති පොකුණෙහි ගැලී, මාර්ගඥාන නැමති ජලයෙන් කෙලෙස් නැමති මළ සෝධා, භය ලජ්ජා නැමති සළු හැඳ, සිල් නැමති සුවඳ විලවුන් ගල්වා, අර්හත්ඵල නැමති ආභරණයෙන් සැරසී, පංච විමුක්ති නම් මල්දම් පැළඳ, සතර සෘද්ධිපාද නැමති මිරිවැඩි පය ලා, නිර්වාණ නැමති පුරයට වැද, ධර්ම නැමති ප්‍රාසාදයට නැගී, නිවන්නැමති මාලේ වෙසෙමින්, චිත්තෛකග්‍රතා සැපයෙන් යුතු ව වසන්නේ ය.”

මෙය චෛත්‍යගිරිවිහාර ප්‍රතිග්‍රහණ කථාවෙහි අරිට්ඨ කුමරුන්ගේ පැවිද්ද ගැන කියන පාඨයකි. ආර්ය මාර්ගයට පිවිස යන්න කතුවරයා දක්වන්නේ ආර්යමාර්ග නැමති පොකුණෙහි ගැලී හෙවත් එම පොකුණෙන් නා යනුවෙනි. නෑමෙන් පුද්ගලයා පිරිසිදු වෙයි. එසේ පිරිසිදු වීම කතුවරයා දක්වන්නේ මාර්ගඥාන නැමති ජලයෙන් කෙලෙස් මළ සෝධා යනුවෙනි. නෑමෙන් පසු ගොඩට එන පුද්ගලයා සළුපිළි හැඳගනී. එය කතුවරයා දක්වන්නේ භය ලජ්ජා නැමති සළු හැඳ යනුවෙනි. උක්ත පාඨය පුරා ම ඇත්තේ එම වර්ණනාත්මක ස්වරූපයයි. මෙවැනි වර්ණනාත්මක විලාසයක් අපට දැකිය හැක්කේ සාහිත්‍ය ග්‍රන්ථයක ම ය.

“ශරත් කාලයෙහි චන්ද්‍රමණ්ඩලය සේ උතුම් සිත්කලු වූ මුව මඬුලු ඇත්තී, සුපිපි නිලුපුල් බඳු වූ දිගු පුළුල් වූ ඇස් ඇත්තී, කෙම්පල සේ රත් වූ අධරපල්ලව ඇත්තී, මාණික්‍යමය වූ කුණ්ඩලාභරණයෙහි මකරමය වූ පත්‍රභංග

www.eduLanka.LK



ඉස්කෝලේ edulanka.lk

කෙළවර රශ්මීන් පහරණ ලද කපෝල ඇති බැවින් කර්ණපල්ලව සහිත වූවාක් වැනි වූ මුඛ ශෝභායෙන් බබළන්නී, රන්වන් වූ ශරීර ඇත්තී...” (නගරප්‍රවේශ කථා)

මෙහි සඳහන් කියමන් මඳක් විමසා බලමු. අනුලා දේවියගේ මුහුණ සරත් කාලයේ සඳ මෙන් උතුම් ය; සිත්කලු ය. එනම් එය බැලීමට සුන්දර වස්තුවකි. ඇස් පිපුණු මහනෙල් මල් මෙනි, එසේ ම

ඒවා දිගු ය, පුළුල් ය. කාන්තාවකගේ නිල් මහනෙල් බඳු දිගු පුළුල් නෙත් සඟලක් සිහි කරන රසික සිත තුළ ඇති විය හැකි හැඟීම් පිළිබඳ ව මඳක් සිතා බලන්න. එපමණක් නොවේ, ඇගේ කම්මුලට කනෙහි පැළඳි අබරණවල සෙලවෙන පත්‍රවලින් නිකුත් වන කාන්තිය වැදීම නිසා මුහුණත් ශෝභායෙන් බබළයි. එසේ ම ඇගේ සිරුර රන්වන් ය.

මෙවන් වර්ණනයක් සැබැවින් ම කාන්තා සිරුර කෙරෙහි අසන්නාගේ සිත ඇද්දවීමේ ගතියෙන් යුක්ත ය. ළාමක සිතක් ඇති කෙනෙකු නම් එවන් රූපයක් සිතේ මවාගෙන එහි රස විඳින මට්ටමකට පත් විය හැකි තරම් ය. මෙවන් වර්ණනා හඳුන්වනු ලබන්නේ ශෘංගාරාත්මක රසයෙන් යුතු ඒවා ලෙස ය. ශෘංගාරාත්මක වර්ණනා ඇත්තේ කොහි ද? සාහිත්‍ය ග්‍රන්ථවල ය.

*“පුෂ්ප නැමති දන්තයෙන් දෙවියන් සතුටු කරන්නා වූ ”*

මේ නන්දන උයන ගැන කියූ කියමනකි. මල් නැමති දත් වලින් දෙවියන් සතුටු කරවන යන කියමන පිළිබඳව මඳක් සිතන්න. ගස් නැමති පුද්ගලයෝ සිය මල් නැමති දත් දෙවියන් වෙත පෙන්වමින් සිනා සෙති. නිකමටත් මල් දෙස බලන විට අපට පෙනෙන්නේ මල් අප දෙස සිනාසෙමින් බලන්නා සේ ය. ඒ සංකල්පනය යොදාගැනීම නිසා මේ දර්ශනය අපගේ සිත් පිනවීමට සමත් නොවන්නේ ද? මෙවන් සිත්කලු සුන්දර යෙදුම් අප දකින්නේ සාහිත්‍ය ග්‍රන්ථවල ය.

*“මන්දමාරුතයෙන් කම්පාවන්නා වූ තරුණ වූ, රත් වූ, කෝමල වූ, පල්ලව නැමති හස්තයෙන් කැඳවා භෘංග නාදයෙන්, ‘සද්ධර්මවර චක්‍රවර්තී වූ බුදුරජාණන් වහන්සේගේ පුත්‍රයෙනි, කොයි යවු ද? මෙසේ එව, අපගේ ශ්‍රී සමෘද්ධිය අනුභව කරව’යි කියන්නාක් වැනි වූ ලියගනන් විසින් පිරිවරන ලදුව...”* (මහාවිහාර ප්‍රතිග්‍රහණ කථා)

මිහිඳු මහ රහතන් වහන්සේ මහා විහාරයෙහි ලෝවා මහා පාය පිහිටුවන තැනට වඩින විට අවට

පිහිටි මල් ගස් හා වැල් උන් වහන්සේ ඇතුළු භික්ෂූන් වහන්සේට කතා කොට ඒ ගස් වැල් වල සුන්දරත්වය විඳින්නට කරන ආරාධනාවක් මෙයින්

අපට සිහිපත් කරවයි. *‘සද්ධර්මවර චක්‍රවර්තී බුදුරජාණන් වහන්සේගේ පුත්‍රයෙනි, කොයි යවු ද? මෙසේ එව’* මේ කතා කරන්නේ කවු ද? උයනේ තිබෙන ගස් ය. හිත් පිත් නැති වැල්වලට පණ දී ඒ වැල් කතා කරන ලෙසක් සිහිපත් කරන මේ කියමන කොතරම් අර්ථවත් ද? මිහිඳු හිමියන් ඇතුළු ධර්මදූත පිරිසේ පැමිණීම නිසා සොබා දහම පවා සතුටට පත් වූ බවක් නේ ද, මේ ව්‍යංගයෙන් කියන්නේ ? මේ වැල්වල දළු හා කොළ සුළඟට සෙලවෙයි. කතුවරයා එය දකින්නේ අත වනා තමන් ළඟට කැඳවන්නාක් ලෙසිනි. කොතරම් ලස්සන කියමනක් ද? මෙවන් ව්‍යංගාර්ථවත් කියමන් මගින් රසවත් අදහස් ඉදිරිපත් කෙරෙන්නේ සාහිත්‍ය ග්‍රන්ථයකින් මිස ඉතිහාස ග්‍රන්ථයකින් වත් ධර්ම ග්‍රන්ථයකින් වත් නොවේ; සාහිත්‍ය ග්‍රන්ථයකිනි.



www.eduLanka.LK

මෙසේ විමසා බලන කල අපට කිව හැකි වන්නේ සිංහල බෝධිවංශය කවර අරමුණකින් රචනා කළත් එය සාහිත්‍යමය වටිනාකමක් ඇති ග්‍රන්ථයක් බවයි.

www.eduLanka.LK



ඉස්කෝලේ
edulanka.lk